WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2016

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## (නව නිර්දේශය)

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- ❖ උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- ❖ සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පැහැදිලි ඉලක්කමින් ලියන්න.
- ❖ ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරු ව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා ඨ

$\frac{60}{100}$ $\frac{20}{30}$

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර

- ❖ අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස් ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ❖ ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

උදාහරණ : මුළු ලකුණු 100

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 100 | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

**අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා**

* කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  (උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

* කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවල දී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

ප්‍රශ්න අංක 03 - (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

## අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

| (අ) | | (ආ) | | (ඉ) | |
|---|---|---|---|---|---|
| (i) | $\frac{54}{100}$ | (i) | $\frac{22}{40}$ | (i) | $\frac{60.5}{100}$ |
| (ii) | $\frac{67}{100}$ | (i) | $\frac{34}{60}$ | (i) | $\frac{81}{100}$ |
| (iii) | $\frac{36}{100}$ | | | | |
| | $3\overline{)157}$ | | | | $2\overline{)141.5}$ |
| | 52.33 | | | | 70.75 |
| | 52% | | 56% | | 71% |

WWW.OLEVELAPI.COM

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



# අභිමතාර්ථ
## I පත්‍රය
## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයින්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10 කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. 2 ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති රචනා මාතෘකා හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදී අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයින් විවිධ ලේඛන ලිවීමේ දී දක්වන දක්ෂතාව, ප්‍රායෝගික ලේඛන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත් පත්‍රිකාවක් සැකසීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් පිළියෙල කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහිදී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමුවන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. 3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමුවෙයි.

5,6,7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීමයි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது [All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** නැඟී සිටින්නට වෙර දරන අයට **අත දීම** හොඳ පුරුද්දකි.
(1) ප්‍රශංසා කිරීම (2) උදවු කිරීම
(3) මිල මුදල් දීම (4) අගය කිරීමට ලක් කිරීම

**2.** ගුරුවරු දරුවන් වෙත **ඇස ගගෙන** බලා සිටිති.
(1) සෝදිසියෙන් යුතුව (2) කරබාගෙන
(3) අනුකම්පාවෙන් (4) ඇස් දල්වාගෙන

**3.** ප්‍රධානියාගේ **මුනිවත රැකීම** සේවකයන්ට ප්‍රහේලිකාවක් විය.
(1) ආගම සිහි කිරීම (2) ඇස් පියාගෙන සිටීම
(3) නිශ්ශබ්දව සිටීම (4) කලබලකාරී වීම

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමග පොත්පත් ................................ ව්‍යාප්ත වන්නට විය.
(1) අවකාශය (2) විකාශනය (3) ප්‍රකාශනය (4) විකාශය

**5.** ශ්‍රී මහා බෝධි වෘක්ෂය පරිත්‍යාග කරන ලද්දේ දේවානම් පියතිස්ස රජුට ........................ ඉන්දියානු පාලකයා වූ අශෝක රජු විසිනි.
(1) අර්ධකාලීන (2) සමකාලීන (3) පශ්චාත්කාලීන (4) යාවත්කාලීන

**6.** සාහිත්‍ය නිර්මාණයක් තුළ අපූර්වත්වයක් ද ...................... ද පැවතිය යුතු ය.
(1) අර්ථාන්විතභාවයක් (2) විස්මිතභාවයක් (3) සමලංකෘතභාවයක් (4) කරුණාන්විතභාවයක්

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කහවණු, කස්තුරි, කාට්ලේජ්, කැඩපත (2) ජනාධිපති, ජනප්‍රවාද, ජලජ, ජාතිකාභිමානය
(3) තරලය, තරුණ, තලතුනා, තානාපති (4) පලාපල, පාචනය, පාවාඩය, පාරිභෝගික

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ස්වාභාවික, ආධ්‍යාත්මික, ප්‍රස්තාවනාව, අවස්ථෝචිත
(2) ව්‍යංග්‍යාර්ථය, විද්‍යාමාන, නීත්‍යානුකූල, කොට්ඨාසය
(3) නිශ්ශබ්දතාව, ප්‍රේම වෘත්තාන්තය, දන්ත ශල්‍යාගාරය, අත්‍යවශ්‍ය
(4) පුස්තකාලය, න්‍යෂ්ටික ප්‍රහාරය, යුධ රහස්, විද්‍යුත් උපකරණ



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. එක් එක් වචනවල මුලකුරෙහි **ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල** සහ **ඇලපිල්ල** පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
   (1) කැත්ත, කුල්ල, මිට, කාලය (2) වැලි, නූල, හිරය, කාලය
   (3) දෙබල, මුල්ල, දූපත, වැට (4) ගෙදර, රූපය, මී කිරි, මාලය

10. 'අනවශ්‍ය' යන වචනය අයත් වන්නේ,
   (1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට ය.
   (3) අන්‍යාර්ථ සමාසයට ය. (4) අව්‍යය සමාසයට ය.

11. "පොලිස් නිලධාරීන් විසින් සිදුකරන ලද මෙහෙයුමේ දී සොරුන් පැනගිය ද සොරාගත් භාණ්ඩ සොයා ගැනිණි." යන වාක්‍යයේ උක්තය වන්නේ,
   (1) සොරාගත් භාණ්ඩ ය. (2) මෙහෙයුමේ දී ය.
   (3) පොලිස් නිලධාරීන් ය. (4) සොරුන් ය.

12. මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදි ව දැක්වෙන්නේ කෙසේ ද?
   (1) මිනි + සාගේ (2) මිනිසා + ගේ (3) මිනිස් + ආගේ (4) මිනිසා + අගේ

13. "නිලධාරීන් විසින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන ලදි." යන වාක්‍යයේ 'නිලධාරීන්' යන පදය අයත් වන විභක්තිය වන්නේ,
   (1) ප්‍රථමා ය. (2) කර්තෘ ය. (3) කර්ම ය. (4) කරණ ය.

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා යහපත් හා සේවයට කැපවූ ගුරු පරපුරක් බිහිකිරීමෙහිලා **පුරෝගාමී විය.**
   (1) මුල් විය (2) නිරත විය (3) උත්සාහවන්ත විය (4) ඉදිරිපත් විය

15. භාෂාවේ විවිධ ස්වරූප **සුසංයෝජනයෙන්** කාව්‍යෝක්ති නිර්මාණය කර ගැනීමට කවිහු උත්සාහ කරති.
   (1) මනාව සංස්කරණය කිරීමෙන් (2) අවබෝධයෙන් යුතුව යෙදීමෙන්
   (3) ප්‍රකට ලෙස යොදා ගැනීමෙන් (4) මැනවින් සම්බන්ධ කර ගැනීමෙන්

16. විභාග ප්‍රතිඵල දැකීමෙන් ඔහු තුළ ඇති වූ **ප්‍රහර්ෂය** මුහුණේ පිළිබිඹු ව තිබිණි.
   (1) දුක්ඛදායක තත්ත්වය (2) අධික සන්තෝෂය
   (3) බියට පත්වූ බව (4) කලබලයට පත්වූ ස්වභාවය

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත උත්තරය තෝරන්න.
   (1) නිපාත - සේ, එහෙත්, විසින්, බඳු
   (2) කෘදන්ත - ලියුම, තිබුණු, වැටීම, දුවන්නා
   (3) තද්ධිත - ජාතික, ධෛර්යවත්, ආයතනික, ස්වදේශීය
   (4) උපසර්ග - ප්‍ර, පර, සිරි, නි

18. යමක් වර්ණනා කිරීම, විස්තර කිරීම, ස්වභාවය දැක්වීම සඳහා යෙදෙන පද
   (1) කෘදන්ත පදයි. (2) තද්ධිත පදයි. (3) නාම පදයි. (4) විශේෂණ පදයි.

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
   (1) ඉක්මන් - සෙද, පොත - ගත, නිතර - නිබඳ, රත්තරන් - රුවන්
   (2) මුහුණ - වත, භයානක - භීම, විදිය - වේ, අඹ - ජලය
   (3) සඳ - සිසි, සිරුර - වෙර, මහත - ස්ථූල, ලුණුව - යොත
   (4) අශ්වයා - හය, කුරුල්ලා - සකුණ, උතුම් - පවර, උවදුර - පිරිපත

20. 'ඉරබටු තරුව' හැඳින්වීම සඳහා යෙදෙන නමක් **නො වන්නේ** කුමක් ද?
   (1) ඕෂධී තාරකාව (2) දවහත් තරුව (3) සැඳෑ තරුව (4) නගුල් තරුව

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** කුමක් ද?
   (1) අනුමාන - ප්‍රත්‍යක්ෂ (2) අභියස - පිටුපස
   (3) ප්‍රච්ඡන්න - විවෘත (4) නිපුණ - ප්‍රවීණ

22. පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   (1) වෙළෙන්දා සේවකයා ලවා කඩය පිරිසිදු කරවයි.
   (2) ඔහු නින්දට යද්දී වැස්ස පටන් ගත්තේ ය.
   (3) තාරිකා දුරකථනය අතට ගෙන පරීක්ෂා කළා ය.
   (4) සමන් සිනා සිසී මා දෙස බැලුවේ ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**23.** **වැරදි** අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) පිල්ලම් භාවිතයේ දී ඖ ස්වරය නියෝජනය කිරීම සඳහා ව්‍යංජන අක්ෂර සමග කොම්බුව සහ ගයනුකිත්ත භාවිත කෙරේ.
(2) කණ්ඨජ අක්ෂර යනුවෙන් හඳුන්වන්නේ දිවේ පසු කොටස උගුර දෙසට ළංවීමෙන් උපදින ශබ්දයි.
(3) ක්‍රීඩා කරද්දී යනු අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාඛ්‍යයකි.
(4) "වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කෙරෙති." යන වාක්‍යයේ රෝගීහු යනු උක්ත කර්මයයි.

**24.** පූර්ව ස්වර ලෝප සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?
(1) නියංසාය (2) සූරත (3) නිරවුල් (4) මලසුන

**25.** දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) කු දා ව ස ත (2) ය පු ලි ජා ත (3) ර මා අ තු ස (4) ණ බු ර ත් ස

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

**26.** එක් කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම
(1) අලි මදිවට හරක් (2) දී කිරට බළල්ලුත් සාක්කි
(3) අනුන්ට කැපූ වලේ තමනුත් වැටේ (4) උඩ පැන්නොත් බිම වැටේ

**27.** තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම
(1) සෙක්කුවේ බැන්ද හරකා වගේ (2) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
(3) අතු කඩා මොර කන්නා වගේ (4) පාරුකාරයාගේ උම්බලකඩේ වගේ

**28.** A - විස්මයාවහ - පුදුමයෙන් තොරව
B - සිවු සඟරාවත - දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
C - කෝ ගිනි කඳ - කෝපය නම් ගිනි ජාලාව
D - දැවුරුදු - දෙ + අවුරුදු

A, B, C, D යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, C හා D පමණි. (4) B, C හා D පමණි.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

**29.** (1) ගුරුවරුන්ගේ මෙහෙවර ඇගයෙති. (2) හොඳ ළමයි ප්‍රශංසාවට ලක්වනු ඇත.
(3) මම සංචාරකයෝ සමග මිත්‍ර වීමි. (4) ඔහු දෙවියකු වැනි මිනිසෙක් ය.

**30.** (1) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි.
(2) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා ප්‍රවීණ සිනමාකරුවෙකුලු.
(3) සමහර මිනිස්සු අවංක නො වන්නේ ඇයි දැයි මට නොතේරේ.
(4) ඔවුන් තරගයට හොඳින් මුහුණ දුන්හයි ගුරුතුමිය පැවසුවා ය.

**31.** A - ජනාධිපතිතුමා ............................. අගමැතිතුමා සමුළුවට සහභාගි වෙයි.
B - ............................. කතා කරන්න. මා ඔබට උදවු කරන්නම්.
C - දේශකයා පැවසූ කරුණු ............................. විවිධ වාද විවාද ඇති විය.
D - දේශනය ............................. විද්වත් පිරිසක් සහභාගි වූහ.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E - පිළිබඳ F - නොහොත් G - සඳහා H - නැවත
(1) E, F, G, H (2) E, G, H, F (3) H, F, E, G (4) F, H, E, G

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මම ගෙදර එන විට යාළුවන් මුණ ගැහුණා."
(1) මා ගෙදර එද්දී මිතුරන් මුණ ගැසුණෙමි. (2) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ.
(3) මා ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ. (4) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණෙමි.

**33.** විලියම් ශේක්ස්පියර් විසින් රචනා කරන ලද නාට්‍යයක් **නො වන්නේ,**
(1) ඔතෙලෝ ය. (2) හැම්ලට් ය.
(3) ද කොකේසියන් චෝක් සර්කල් ය. (4) ඇන්තනි ඇන්ඩ් ක්ලියෝපැට්රා ය.

**34.** උපමාවක් සහිත කවි පදය තෝරන්න.
(1) සිසිවන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින (2) ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙවඟන
(3) විදෙන ලෙළෙන නරුබර පුළුලුකුළ රැදී (4) සැළලිහිණිය වදු කැලණිය පුරවරට



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

35. 'එක් තිඹිරි රුකකට නැගී නොවිළික්සුණු එල අනුභව කරනුයේ' යන පාඨයෙහි නොවිළික්සුණු යන වචනයේ අදහස කුමක් ද?
(1) ඉදී නැති (2) නොපිපිරුණු (3) කෑමට නුසුදුසු (4) රසවත් නැති

36. පහත සඳහන් ගී බණ්ඩයේ හතරවැනි පදය තෝරන්න.
"බලි තරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ලද ලංකා
පුලතිසි දැමි සිරි රහල් කුමරතුඟු පඬුවන් ලද ලංකා
විදු සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද ලංකා
....................................................................."
(1) සමනොළ කිරිගල් පිදුරුතලා ඈ කෙහෙ ගැට බැඳි ලංකා
(2) මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා
(3) තේ වතු පොල් වතු කෙත් වතු පෙළ උකුලේ නළවන ලංකා
(4) ඔබ රැකුණොත් ලෝකුඹුව ද අපහට සීත ගඟුලි ලංකා

37. "මගේ මිත්‍ර ඉලෝ පුබොලාඩ්සේ, මොක ද අපි මේ කාරණාව එළි කළා ම ඇති වැරැද්ද? අඹෂ්විල්ලි වතුපිටිවලට අයිතියක් නැද්ද ඔය කොලු පැටියට වගේ ම මේ මනුස්සයට?" යන දෙබස් බණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?
(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) කිරිමුට්ටිය ගඟේ ගියා

38. හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහරේ දී අලියන් වේලාව යනු,
(1) අලි ගමන් කරන වේලාවයි. (2) රාත්‍රි කාලයයි.
(3) අඳුර වැටෙන වේලාවයි. (4) උදෑසන කාලයයි.

39. පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
"තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වර සුර පුරෙහිවත් නො වසති නිරය ලෙද
ගොරතර නිරෙහි වත් පරනට වැඩ ඇති ද
සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ
(1) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් මිනිසුන් නරක වැඩ නොකරතත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. අන්‍යයන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකය සේ සලකා දුෂ්කර ලෙස අපායේ වුව ද වාසයට කැමතිය.
(2) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් ජනයා අනෙක් අයට යහපතක් නොවේ නම් උතුම් දිව්‍ය ලෝකය වුවත් අපාය සේ සලකා එහි වාසය නොකරති. එහෙත් අනුන්ට යහපතක් කළ හැකි නම් අතිශය ඝෝර වූ අපායෙහි වුවත් දිව්‍ය ලෝකය සේ සලකා හැසිරෙති.
(3) ස්ථිරසාරවූ ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකළත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. එහෙත් ඝෝර වූ අපායෙහි වුව ද අනුන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකයෙහි මෙන් සලකා වාසය කරති.
(4) ස්ථිරසාර ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකරන අතර දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. ඝෝරවූ විශාල අපායෙහි වුවත් නරක වැඩ නැති නම් එහි දිව්‍ය ලෝකය සේ සලකා නිරන්තරයෙන් හැසිරෙති.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.
"සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළිවන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇතිවන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය."
(1) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීම පාඨකයාට වින්දනයක් ඇති වන පරිදි ඉදිරිපත් කිරීමෙන් ඔහුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.
(2) සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලිත්වය මතුවන්නේ තමන් තෝරා ගන්නා අරුත්බර අත්දැකීම වින්දනීය ලෙස ඉදිරිපත් කිරීම නිසා ය.
(3) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීමක් වින්දනීය ලෙසින් නැවත ඉදිරිපත් කර ඇති ආකාරයෙන් ඔහුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.
(4) අරුත්බර අත්දැකීමක් තෝරාගෙන එය වින්දනීය ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි නම් එමගින් සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2016

| විෂයය අංකය பாட இலக்கம் | 21 | විෂයය பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය (නව නිර්දේශය) |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු

## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 4 | 31. | 4 |
| 02. | 1 | 12. | 3 | 22. | 3 | 32. | 3 |
| 03. | 3 | 13. | 2 | 23. | 3 | 33. | 3 |
| 04. | 3 | 14. | 1 | 24. | 2 | 34. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 4 | 35. | 1 |
| 06. | 1 | 16. | 2 | 26. | 1 | 36. | 4 |
| 07. | 3 | 17. | 4 | 27. | 2 | 37. | 2 |
| 08. | 1 | 18. | 4 | 28. | 4 | 38. | 3 |
| 09. | 2 | 19. | 1 | 29. | 4 | 39. | 2 |
| 10. | 4 | 20. | 4 | 30. | 4 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்: 25 / 40



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## II පත්‍රය

ප්‍රශ්න අංකය 01

**අපේක්ෂණය** - **භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
   **(අ)** පතල **(ආ)** පතළ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
   "කසල කළමනාකරණය පිළිබඳ පවතින ගැටලු නිරාකරනය කිරීම කාලීන අවශ්‍යතාවක් බව පරිසරවේදීහු පෙන්වා දෙති."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
   **(අ)** උදර + ආබාධ **(ආ)** ඉන් + ඉක්බිති

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.
   "පරිසර සංරක්ෂණය පිළිබඳව උපසභාපතිතුමා පැවැත්වූ කතාවට සියල්ලෝ ම කොන්දේසි විරහිතව එකඟතාව දැක්වූහ."

(v) පහත සඳහන් පද්‍ය පාඨයේ **තද කළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
   "අසන **පිසින්** නයි කැල **ඔසළෝ යා**"

(vi) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
   **(අ)** බස්නාහිර සහ උතුර අතර ඇති අනුදිශාව
   **(ආ)** දුරදිග බලා ක්‍රියා කරන

(vii) පහත දැක්වෙන යෙදුම් සඳහා හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
   **(අ)** පාවහන් **(ආ)** අලියා

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්, ඒවා නිදොස් කර නැවත ලියන්න.
   **(අ)** ඹී තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරති.
   **(ආ)** ක්‍රීඩකයෝ තරගය දිනති'යි පුහුණුකරුවෝ සිතූහ.

(ix) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තද කළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
   **(අ)** රියදුරා මාර්ග නීති **කඩකරමින්** රිය පැදවූයේ ය.
   **(ආ)** සියලු දෙනා ම විභාගයෙන් **සමත් වෙත්වා**'යි කියමින් ගුරුතුමිය සමුගත්තා ය.

(x) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
   **(අ)** විශේෂ දෙසුම **(ආ)** කර්තෘ වැකි

(i) (අ) පතල - ආකරය (භූගත ඛනිජ වර්ග ලැබෙන)

(ආ) පතළ - පැතුරුණු, ප්‍රසිද්ධ, ව්‍යාප්ත, ප්‍රකට

නිවැරදි අක්ෂර වින්‍යාසය හා උක්ත අඛ්‍යාත සම්බන්ධය සහිත අර්ථවත් වාක්‍ය ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ii) කසළ

නිරාකරණය

WWW.OLEVELAPI.COM

(iii) (අ) උදරාබාධ - පූර්ව ස්වර ලෝප සන්ධිය එක කොටසක් හරි නම් ½ දෙන්න

(ආ) ඉනික්බිති - ස්වර සන්ධිය / ආගමෝහරණ සන්ධිය / සරසඳි

(iv) සංරක්ෂණය - සං

පිළිබඳව - පිළි

උපසභාපතිතුමා - උප

විරහිතව - වි

පරිසර - පරි

උපසර්ගය පමණක් ලියා තිබීම ද ප්‍රමාණවත්ය. උපසර්ගය සහිත පදය ලියා තිබුණත් ලකුණු දෙන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(v) රිසින් - කැමැත්තෙන් / ආශාවෙන් / රිස්සෙන් / රුචියෙන් / බලාපොරොත්තුවෙන් / අදහසින් / අපේක්ෂාවෙන් / රිජ්සාවෙන් / අභිලාෂයෙන් /

ඔසලෝයා - රැස්වූහ / එක්වූහ / පැමිණියහ / රොක්වූහ

(vi) (අ) වයඹ

(ආ) දූරදර්ශී / දුර දක්නා

(vii) (අ) වාං පතුල් /

(ආ) මහ එකා /

(viii) (අ) ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරයි / කරන්නීය.

(ආ) ක්‍රීඩකයන් තරගය දිනති'යි පුහුණුකරුවෝ සිතූහ / සිතුවෝය.

ක්‍රීඩකයින් තරගය දිනතියි පුහුණුකරුවෝ සිතූහ / සිතුවෝය.

(ix) (අ) මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය / කෘදන්ත ක්‍රියා / ක්‍රියා නිපාත / නෛපාතික ක්‍රියා

(ආ) ආශීර්වාද ක්‍රියා / ප්‍රාර්ථනා ක්‍රියා / ආසී කිරිය

(x) (අ) විශේෂ දේශනය / වෙසෙස් දෙසුම / විසෙස් දෙසුම

(ආ) කර්තෘ වාක්‍ය / කතු වැකිය

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ප්‍රශ්න අංකය 02

**අපේක්ෂණය** - **සංශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

**2.** පහත දැක්වෙන **(අ). (ආ). (ඉ). (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** මේ වන විට ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින විශාල ප්‍රමාණයේ ඉඩම් කැබලි කර විකිණීම මගින් ප්‍රබල සමාජ ප්‍රශ්න කිහිපයක් උද්ගත වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝගයක් වන පොල් වගාව විනාශ මුඛයට පත්වීම ඉන් එකකි. ළිඳක්, වැසිකිළියක් සහ විධිමත් පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයක් වැනි අත්‍යවශ්‍ය මූලික අංගෝපාංග පවා ඉදිකර ගැනීමට ප්‍රමාණවත් නොවන පුළු ඉඩකඩක් සහිත මේ බිම්කට්ටිවල ජීවත් වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් එල්ලවීම තවත් ප්‍රශ්නයකි.

**(ආ)** වසවිසෙන් තොර කෘෂිකර්මාන්තයක් මෙරට ස්ථාපනය කිරීම පිළිබඳව මේ දිනවල විවිධ යෝජනා ඉදිරිපත් වෙමින් පවතී. රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය දැනටමත් ක්‍රියාත්මක ය. මෙම ක්‍රියාවලියට සමගාමීව රුක්රෝපණය වැනි ව්‍යාපෘති ද ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වන්නේ කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීම උදෙසා මෙන් ම පරිසර සංරක්ෂණය උදෙසා ද එමගින් පිටුබලයක් සැපයෙන බැවිනි.

**(ඉ)** ළමා මනසට ගෝචර වන චිත්‍රපට නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වෙමින් පවතී. එහෙත් ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට නොමැති තරම් ය. අර්ථවත් තේමා සහිත ළමා චිත්‍රපට ළමයින්ට විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් මෙන් ම විවිධ තොරතුරු සම්බන්ධයෙන් දැනුම ලබාදෙන මාධ්‍යයක් වශයෙන් ද භාවිත කිරීමේ හැකියාව පවතී.

**(ඊ)** සමුද්‍රීය පරිසර දූෂණය හෙවත් වෙරළාසන්න පරිසර දූෂණය අතින් ශ්‍රී ලංකාව පස්වන ස්ථානයේ පවතින බව පසුගියදා පුවත්පත් වාර්තාවක පළ වී තිබිණි. මෙරටට විදේශ විනිමය උපයා ගැනෙන ප්‍රධාන ක්‍රමවේදයක් වන සංචාරක ව්‍යාපාරය කෙරෙහි මෙන් ම විශේෂයෙන් ම වෙරළාසන්න ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි ද ඍණාත්මක ව බලපාන සමුද්‍රීය පරිසර දූෂණය වළක්වා ගැනීමේ ක්‍රමෝපාය කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි.

අ.
- ඉඩම් කැබලි කර විකිණීම නිසා මතු වන සමාජ ආර්ථික ගැටලු.
- ඉඩම් කැබලි කර විකිණීමෙන් මතු වන ප්‍රශ්න.
- ඉඩම් කැබලි කර විකිණීමෙන් මතු වන ආර්ථික පාරිසරික හා සමාජයීය ගැටලු

ආ.
- වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් ස්ථාපනය කරමු.
- පරිසර සංරක්ෂණයට නැඹුරු වූ කෘෂිකර්මාන්තයක් උදෙසා
- කාබනික පොහොර භාවිතයෙන් කෘෂිකර්මාන්තය නංවමු.

ඉ.
- ළමයින් සඳහා අර්ථවත් චිත්‍රපට නිෂ්පාදනය කරමු.
- ළමා ලෝකය අර්ථවත් කරන්නට ළමා චිත්‍රපට මාධ්‍ය යොදා ගනිමු.
- සංවර්ධනය කළ යුතු ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට කලාව

ඊ.
- සමුද්‍රීය පරිසර දූෂණය වළක්වා ගනිමු.
- සමුද්‍රීය පරිසර සංරක්ෂණයෙන් අපට ලැබෙන ප්‍රයෝජන

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව - ලකුණු 08යි
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි

01. සාරවත්භාවය - ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ සැලකිය යුතුයි

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 - 65** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අද පවතින වෙළෙඳ ව්‍යාපාරවල එකම අරමුණ වී ඇත්තේ අධික ලෙස මුදල් ඉපයීමයි. මේ සඳහා වෙළෙන්දන් හැකි සෑම උපක්‍රමයක් ම යොදන අතර ඔවුන්ගේ අදහස් ක්‍රියාවට නංවන වෙළෙඳ දැන්වීම්කරුවෝ ද එය ඒ අයුරෙන් ම ක්‍රියාවට නඟති. තරගකාරී තත්ත්වයට පත්ව ඇති මෙම වාණිජමය අරමුණු සේවා හා භාණ්ඩ මගින් ක්‍රියාත්මක වේ. පාරිභෝගිකයා දිනා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපක්‍රම රටේ සංස්කෘතියට, සභ්‍යත්වයට හා අනාගත පැවැත්මට කොතරම් හිතකර ද යන්න ගැන තැකීමක් නොකිරීම කනගාටුවට කරුණකි. මෙම වෙළෙඳ උපක්‍රමවලට සාමාන්‍ය ජනතාව පමණක් නොව දැන උගත් අය පවා රැවටෙන අවස්ථා අපමණ ය.

අද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා පමණක් නොව විවිධ දැන්වීම් මගින් ද තම භාණ්ඩ හෝ සේවාව සැමට ම වඩා වාසිදායක හා ලාභ බව පැවසීමට එහි නිරතවන කිසිවෙක් පසුබට නොවෙති. ඇත්ත නැත්ත වටහා ගැනීමට බැරි තරමට ප්‍රයෝගකාරී දර්ශන පෙන්වනවා පමණක් නොව ඒ ගැන රසකරමින් කියන වාර ගණන ද අසීමිත ය. ඔවුන්ගේ වාණිජ පරමාර්ථය මේ ආකාරයෙන් ඉටු වුවත් ඉන් සමාජයට වන බරපතල හානි අපමණ ය. ව්‍යාපාරිකයා පිනවා විශාල මුදලක් ලබා ගැනීමට උත්සාහ දරන දැන්වීම්කරුවා ජනතාවගේ සිත ආකර්ෂණය කර ගැනීමට වෙළෙඳ භාණ්ඩයේ නැති ගුණ වනයි. මාධ්‍යය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙලඹෙති.

**සාරාංශකරණය :**

**මුළු ලකුණු ප්‍රමාණය 10යි.**

**ලකුණු විග්‍රහය :**

01. අන්තර්ගතය - *ලකුණු 06යි.*

02. වචන ගණන - *ලකුණු 02යි.*

03. ශිල්පීය දක්ෂතා - *ලකුණු 02යි.*

**අන්තර්ගතය :**

i. වෙළෙඳ ව්‍යාපාරවල එකම අරමුණ අධික ලෙස මුදල් ඉපයීමයි.
ii. ඒ සඳහා වෙළෙන්දෝ විවිධ උපක්‍රම භාවිත කරති.
iii. ප්‍රචාරණයේදී සංස්කෘතිය පිළිබඳව අවධානය යොමු නොකිරීම කණගාටුදායකය.
iv. මේ වෙළෙඳ උපක්‍රමවලට බොහෝ දෙනා රැවටෙති.
v. වෙළෙඳ දැන්වීම්වලින් වාණිජ පරමාර්ථ ඉටු වුවත් ඉන් සමාජයට වන හානිය බරපතල වේ.
vi. භාණ්ඩවල නැති ගුණ වර්ණනා කළත් මාධ්‍ය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙළඹෙති.

වචන ගණන 70 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 65 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 50ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 70ට වැඩි කල්හි හෝ 50ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 පිරිනමන්න.

70ට වැඩි කල්හි වචන [illegible]



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ප්‍රශ්න අංකය 04

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කරන ලද්දේ සියබස්ලකර විසිනි. කාව්‍යයේ ස්වරූපය හා වර්ණනා ක්‍රමය කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳ නීතිරීති මෙම ග්‍රන්ථය මගින් පනවන ලදි. මහාකාව්‍යය උසස් ම කාව්‍යය හැටියට සලකන ලදි. කව්සිළුමිණ වැනි ආදි ම පද්‍ය කාව්‍යයන් පටන්, ඉතා මෑත කාලයක ලියවුණු කාව්‍යයන් දක්වා, පැරණි සම්ප්‍රදායන් අනුව කවි ලියූ හැම කවියෙක් ම සියබස්ලකරින් නිශ්චිත, කවි සමය ගුරු කොට ගත්තේ ය. 'පෙදෙන් බුදු සිරිත් ඈ' යනාදි වශයෙන් පද්‍යයට වස්තු විය යුත්තේ බුද්ධ චරිතයක් බව සියබස්ලකරින් පැවසිණි. ඒ අනුව ගිය සිංහල කවීහු සිය කෘතීනට ජාතක කථා වස්තු කොට ගත්හ. කාව්‍යයේ අලංකාර ගැබ්විය යුතු යයි ද, ඍතු ආදි වර්ණනා ගැබ්විය යුතු යයි ද, යන අදහස සිංහලයේ පතුරුවන ලද්දේ සියබස්ලකර විසිනි.

සංස්කෘත කාව්‍ය ලක්ෂණ සිංහල කාව්‍යයට ඇතුළත්ව ඇති බවත්, සිංහල කවීන් සංස්කෘත පොත පත අනුගමනය කළ බවත්, පැරණි සිංහල සාහිත්‍යය පිරික්සන විචාරකයෝ පවසති. සිංහල කාව්‍යය අලංකාරවාදයේ ඵලයක් හැටියට හඳුන්වති. සකු කවියන් අනුව යෑමට සිංහල කවීනට අනුබල දුන්නේ සියබස්ලකරයි. සිංහල කවීහු හැම දෙන ම සියබස්ලකරින් උගන්වන ලද කවි සම්ප්‍රදාය තදින් වැළඳ ගත්හ. අනුරාධපුර යුගයේ දී සියබස්ලකර වැනි ග්‍රන්ථයක් රචනා කිරීමෙන් ම පෙනී යනුයේ ඒ අවධිය වන විට බෙහෙවින් දියුණු වූ සිංහල කාව්‍ය සාහිත්‍යයක් බිහිව තිබුණු බවයි.

(i) පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කෙරුණු සියබස්ලකරෙන් පනවන ලද්දේ කුමක් ද?
(ii) පැරණි සම්ප්‍රදායට අයත් හැම කවියෙක් ම ගුරු කොට ගත්තේ කවර දෙයක් ද?
(iii) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට සිංහල කවීහු සිය කෘතිවලට වස්තු විෂය කරගත්තේ මොනවා ද?
(iv) මෙහි සඳහන් වන ආදිම පද්‍ය කාව්‍යයක් වන ග්‍රන්ථයෙහි නම කුමක් ද?
(v) අනුරාධපුර යුගයේ දියුණු කාව්‍ය සම්ප්‍රදායක් පැවති බවට මෙම පාඨයේ ඇතුළත් සාක්ෂිය කුමක් ද?

**අවබෝධය : මුළු ලකුණු ප්‍රමාණය 10යි. (2 x 5 = 10)**

(i) කාව්‍යයේ ස්වරූපය හා වර්ණනා ක්‍රමය කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳ නීති රීති / කාව්‍ය රචනය පිළිබඳ නීති රීති / කාව්‍ය ආකෘතිය හා නිර්මාණය පිළිබඳ නීති රීති.

(ii) සියබස්ලකරින් නිශ්චිත කවිසමය

(iii) ජාතක කථා

(iv) කව් සිළුමිණ

(v) සියබස්ලකර රචනා කිරීම / සියබස්ලකරින් නිශ්චිත කවි සමය ගුරු කොට ගැනීම / සියබස්ලකරේ ඉගැන්වීම් භාවිත වීම / සියබස්ලකර
[illegible]

ප්‍රශ්න අංකය 05

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂයා සතු කුසලතා මැනීම

**5.** මිරිහාන ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ දී සිදු කෙරුණු සාකච්ඡාවකින් කොටසක් පහත දැක්වේ. මින් අදාළ කරුණු පමණක් තෝරාගෙන වචන **100**කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රාදේශීය සභාවේ ලේකම් මහේන්ද්‍ර ජයලත් ඔබ යැයි සිතන්න.

- අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත එකතු වන අපද්‍රව්‍ය මගින් පරිසරයට විශාල හානියක් සිදු වෙනවා. වැහි කාලෙට වතුර බහින්නෙ නෑ. මදුරුවෝ බෝ වෙනවා. දුගඳ හමනවා.
- මිනිස්සු කිසිදු වග විභාගයක් නැතුව තමන්ගේ ගෙවල් අසල තියෙන හිස් ඉඩම්වලටයි පාරවල් අයින්වලටයි කුණු විසිකරන්න පුරුදු වෙලා.
- මේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩමුළුවක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕනෑ.
- මේ සඳහා දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය වෙන වෙන ම ඉවත් කිරීමට අදාළ භාජන අපි නොමිලයේ ලබා දෙන්න ඕනෑ.
- දිරාපත් වන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්න දිරිගන්වන්නත් පුළුවන්.
- අපි කොහොමද මේ ව්‍යාපෘතියට මිනිස්සු යොමු කරන්නේ?
- 'එච් එතෙනදි අපි මෙහෙම කරමු. කාබනික පොහොර නිෂ්පාදනය හා දිරාපත් නොවන ප්ලාස්ටික්, වීදුරු වැනි අපද්‍රව්‍ය. කළමනාකරණය කිරීම ගැන ගම්මට්ටමින් වැඩමුළු පවත්වලා මිනිස්සු දැනුවත් කරමු.
- මේ විදියට නිපදවන කාබනික පොහොර ප්‍රාදේශීය සභාව මගින් මිල දී ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරමු. ඒ මගින් වැඩි ම ආදායම් උපයන පුද්ගලයන්ට තව-තවත් ඒ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා මුදල් ආධාර ලබා දෙමු. මේ විදියට විධිමත් පරිදි කාබනික පොහොර නිපදවන අය අතුරෙන් 1, 2, 3 ස්ථානවලට පිළිවෙළින් රුපියල් 40 000, 30 000 සහ 20 000 බැගින් ද තවත් දිරිගැන්වීම සඳහා සහතික පත්‍ර ද දෙන්න පුළුවන්.
- මේ ගැන ප්‍රදේශයේ ජනතාව හැකි ඉක්මනින් දැනුවත් කරන්න ඕනෑ.
- ඒ සඳහා ආකර්ෂණීය අත් පත්‍රිකාවක් පිළියෙල කර බෙදා හැරීමට ලේකම්තුමාට පවරමු.

**නැතහොත්**

කොළඹට ඉතා දුරින් පිහිටි 'ඇතා වැටුණු වැව' ග්‍රාමයේ පවුල් 250ක් පමණ ජීවත් වේ. පොදුවේ මේ පවුල්වල ජීවත්වන්නන්ගෙන් බොහොමයක් තම ජාතික හැඳුනුම්පත ලබාගෙන නොමැත. විවිධ වූ පෞද්ගලික හා සමාජීය කටයුතුවල දී අත්‍යවශ්‍ය වන හැඳුනුම්පත කොළඹට නොගොස් තම ග්‍රාමයේ දී ම ලබා ගැනීම සඳහා ජංගම සේවාවක් පැවැත්වීමට විධිවිධාන යොදන මෙන් ඉල්ලා සිටිමින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. ඇතා වැටුණු වැව ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ජයලත් මහින්ද ඔබ යැයි සිතන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ලකුණු විග්‍රහය : මුළු ලකුණු 15යි**

අත්පත්‍රිකාව - **ලකුණු 15යි.**

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබා ගන්න.

| | | |
|---|---|---|
| 01. | ආකෘතිය සඳහා | *ලකුණු 05යි* |
| 02. | අන්තර්ගතය සඳහා | *ලකුණු 07යි* |
| 03. | ශිල්පීය දක්‍ෂතා සඳහා | *ලකුණු 03යි* |

1. ආකෘතිය සඳහා ලකුණු ~~04~~ 05යි

| | | |
|---|---|---|
| 1. | මාතෘකාව | *ලකුණු 01යි* |
| 2. | පළකරන්නාගේ නම, තනතුර | *ලකුණු 01යි* |
| 3. | පළකරන දිනය | *ලකුණු 01යි* |
| 4. | නිර්මාණාත්මක බව | *ලකුණු 02යි* |

2. අන්තර්ගතය සඳහා ලකුණු 07යි

| | | |
|---|---|---|
| 1. | අපද්‍රව්‍ය නිසා පරිසරයට වන හානිය (ජලය ගලා නොබැසීම, දුගඳ හැමීම, මදුරුවන් බෝවීම. | *ලකුණු 01* |
| 2. | මිනිසුන් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම. | *ලකුණු 01* |
| 3. | අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්විය යුතු බව. | *ලකුණු 01* |
| 4. | අපද්‍රව්‍ය වෙන වෙනම ඉවත් කිරීමට භාජන නොමිලයේ ලබා දීම. | *ලකුණු 01* |
| 5. | දිරාපත් වන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම. | *ලකුණු 01* |
| 6. | කාබනික පොහොර මිලදී ගැනීමේ වැඩ පිළිවෙළක් ඇරඹීම. | *ලකුණු 01* |
| 7. | වැඩිම ආදායම් උපයන අයට ත්‍යාග හා සහතික පත්‍ර ලබාදීම. | *ලකුණු 01* |

3. ශිල්පීය දක්‍ෂතා ලකුණු 03යි

WWW.OLEVELAPI.COM

**03. ශිල්පීය දක්‍ෂතා සඳහා ලකුණු 03යි**

නිවැරදි අක්‍ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්‍ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

නැතහොත්

රාජකාරි ලිපිය *ලකුණු 15*

**ලකුණු විග්‍රහය :**

- ආකෘතිය 05
- අන්තර්ගතය 07
- ශිල්පීය දක්ෂතා 03

✶ ආකෘතිය සඳහා *ලකුණු 05*

- යවන්නාගේ නම, ලිපිනය, දිනය *ලකුණු 01*
- ලබන්නාගේ ලිපිනය *ලකුණු 01*
- ආමන්ත්‍රණය *ලකුණු 01*
- මාතෘකාව *ලකුණු 01*
- තනතුර හා අත්සන *ලකුණු 01*

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

✶ අන්තර්ගතය සඳහා *ලකුණු 07*

අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු

- කොළඹට ඉහාදුරින් පිහිටි ඇතා වැටුණු වැව ග්‍රාමය *ලකුණු 01*
- එහි 250ක් පමණ වන පවුල් සංඛ්‍යාවක් ජීවත් වීම *ලකුණු 01*
- වැඩි දෙනෙකු ජාතික හැඳුනුම්පත ලබා නොතිබීම *ලකුණු 01*
- විවිධ පෞද්ගලික කටයුතුවලදී ජාතික හැඳුනුම්පතෙහි අවශ්‍යතාව *ලකුණු 01*
- විවිධ සමාජ කටයුතුවලදී එහි අත්‍යවශ්‍ය බව *ලකුණු 01*
- තම ග්‍රාමයේදී එය ලබා ගැනීමට ජංගම සේවාවක් පැවැත්වීමේ අවශ්‍යතාව *ලකුණු 01*
- ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත කරන ඉල්ලීම *ලකුණු 01*

✶ ශිල්පීය දක්ෂතා *ලකුණු 03*

✶ ආකෘතිය සඳහා ලකුණු පිරිනැමීමේදී පැරණි ක්‍රමය හා නව ක්‍රමය යන දෙකම පිළිගන්න.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

- ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

ප්‍රශ්න අංකය 01

අපේක්ෂණය - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20යි

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "අඟුල්මල් සොර 'රජ මා කරා එ' යනු දැනැ පළමු අවුදු දෙව්රම්හි හුන්නෙ යැ. රජු ගත."
- (අ) ඉහත සඳහන් පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.
- (ආ) එම ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ii)
රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න
වැහි වතුර ඉහිහවා නම් ඔවුන් විසිළුවට
කුරුල්ලෝ ඉහිල්ලී වරෙන් නුඹ මා ළඟට
- (අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් පද්‍ය පන්තියේ නම ලියන්න.
- (ආ) එම කවි පෙළෙහි රචකයා නම් කරන්න.

(iii)
- (අ) 'අපට වැසිකිළියක්' කෙටි කතාව උපුටා ගත් කෙටි කතා සංග්‍රහය නම් කරන්න.
- (ආ) 'අපට වැසිකිළියක්' කෙටි කතාවේ රචකයාගේ නම ලියන්න.

(iv)
**වර** වෙණ නද අසමින් සිත සතොසිනි
**සර** හැර සියොකුන් පියපත් විදමිනි
පුර' ඹර වසමින් සිටි රඟ කුම වැනි
- (අ) මෙහි ඉතිරි කවි පදය ලියන්න.
- (ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(v) "රාළහාමි, ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළ යි කියලා දැනගන්ඩ ලැබුණ ද?"
- (අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
- (ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(vi)
වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ
- (අ) මෙම කවියේ 'සකිය' යන්නෙහි අර්ථය ලියන්න.
- (ආ) මෙම කවිය කවර ජන කවි ගණයට අයත් ද?

(vii)
- (අ) ජාතක කතා මුල් කරගත් **ගී කාව්‍ය** ග්‍රන්ථ **දෙකක්** ලියන්න.
- (ආ) උම්මග්ග ජාතකයෙහි සතර කත් මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතර ද?

(viii)
දැතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි
- (අ) ඉහත ගීත ඛණ්ඩය ඇතුළත් ගීතයේ රචකයාගේ නම ලියන්න.
- (ආ) 'දහදිය මුතු ඇට' යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?

(ix)
- (අ) 'දියමන්ති මාලය' කෙටි කතාවේ මුල් රචකයාගේ නම ලියන්න.
- (ආ) නිර්දිෂ්ට 'දියමන්ති මාලය' කෙටි කතාව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(x)
ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරැරා
අසන නිතියෙනා
- (අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් නිර්මාණය කුමක් ද?
- (ආ) මෙහි 'ප්‍රේමවන්ත දරුවෙනි මා' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(i) (අ) අමාවතුර

(ආ) ගුරුළුගෝමී

(ii) (අ) වස්සානය

(ආ) රත්න ශ්‍රී විජේසිංහ

(iii) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා

(ආ) කේ. ජයතිලක

(iv) (අ) සුර සෙනඟට සුර'සුන් පැන වූ වැනි

(ආ) වර - උතුම් / විශිෂ්ට / උසස් / ශ්‍රේෂ්ඨ / ප්‍රශස්ත

සර - ගමන් / සංචාරය / පියාසර / චලනය /

(v) (අ) පුංචිමැණිකා

(ආ) බැද්දේගම

(vi) (අ) මිතුර / යහළුව / සබඳ / සගය / මිත්‍රය

(ආ) උපදේශාත්මක ජන කවි / උපදෙස් සඳහා කී කවි /

(vii) (අ) මුවදෙව්දා වත, සසදා වත, කව් සිළුමිණ

(ආ) චූලනී බ්‍රහ්මදත්ත / බ්‍රහ්මදත්ත / උත්තර පංචාල නුවර බ්‍රහ්මදත්ත රජු හා කේවට්ට බමුණා අතර

(viii) (අ) මහගමසේකර

(ආ) රූපක

(ix) (අ) ගී ද මෝපසාං

(ආ) කේ.ජී. කරුණාතිලක

WWW.OLEVELAPI.COM

(x) (අ) සිංහබාහු නාට්‍යය

(ආ) සිංහබාහුට හා සිංහසීවලීට



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ප්‍රශ්න අංකය 02

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ අවබෝධය

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි (එක් කොටසකට ලකුණු 04 බැගින්)**

(අ) කොටස *ලකුණු 02*

(ආ) කොටස *ලකුණු 02*

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "කොල, වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු, දොරටු, අටලු, වාසල්, බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙන'වුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව; වේදෙහ රජහු ඉසත් වහා ගෙනෙව" යි කීහ.

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii)
තත මතු ද සින්දේ
**පිළිමල්** දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය **සිරි සඳ** ගෙන වැලැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iii) 'සොර ක්ලාන්ත වි යැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි.'

(අ) පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

✱ (iv)
නිල තුරඟුට නැඟෙමින් රිවි දෙවි සිරින
දුල කැර සේසත් මිණි බරණ කිරණින
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) බබළවමින් සහ සූර්යයා යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන **දෙක** ලියන්න.

(ආ) යාපා පටුන ජයගෙන සපුමල් කුමරුන් පැමිණෙන ආකාරය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(v)
කැර මිණි බරණ රැස්
රසින් **සුරසැවු** සුවහස්
සුරන් සහ **සගසැස්**
නො කැර සිටියේ අහස් කුස හිස්

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කවියේ අර්ථය ලියන්න.

*(ලකුණු 04 x 05 = 20)*

WWW.OLEVELAPI.COM

(i) (අ) කොමඩු බානා සේ

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජ, එක් සියයක් රජ දරුවන් හා සේනාව සමඟ ගොස් මියුලු නුවර වටලා ගෙන සිටියදී එම නගර වැසියන් සැණකෙළි පැවැත්වීමට හේතුව චර පුරුෂයකුගෙන් අසා දැන ගත් බ්‍රහ්මදත්ත රජතුමා කෝපයට පත් ව තම සේනාවට දුන් උපදෙසකි.

(ii) (අ) පිළිමල් - ප්‍රතිමල්ලව / විරුද්ධවාදීන් / සතුරන් / සතුරන්

සිරිසඳ - ශ්‍රී සම්පත්තිය / ශ්‍රියා කාන්තාව / ශ්‍රීය / සිරිකත

සින්දේ වීණා තත පමණක් නොවේ. සතුරාගේ ආඩම්බරය ද සුන් කර දමා කීර්තිය සියලු දිශාවන්හි පැතිරවීය. විජය ශ්‍රී කාන්තාව කැඳවා වැලඳ ගත්තේය.

(iii) (අ) සොරා ක්ලාන්ත බවට පත් විය. කටෙහි කෙළ සිඳී ගියේය. සිරුරෙන් දහඩිය වැගිරෙයි.

(ආ) අංගුලිමාල බුදුරදුන් පසුපස හඹා ගොස් වෙහෙසට පත් වූ අවස්ථාව.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv) (අ) බබළවමින් - දුල කැරැ

සූර්යයා - රිවි දෙව් / රිවි

(ආ) සූර්ය දිව්‍ය රාජයාගේ ආකාරයෙන් කළු (නිල්) අසු පිට නැගී, මැණික් ආභරණවල කාන්තියෙන් සේසත බබළවමින්, යාපා පටුන ජය ගෙන බලයෙන් පිරුණු සේනාව සමඟින්

(v) (අ) සුරසැවු - දේදුනු / ඉඳුදුනු / ඉන්ද්‍රචාප / / ඉඳුසැවි

සහසැස් - ශක්‍රයා / සුර රද / සුරිඳු / වජිරපාණී

(ආ) **මාණික්‍ය ආභරණ රාශීන්ගේ රශ්මියෙන් බොහෝ දේදුනු ලක්ෂ ගණන් ඇති කොට ශක්‍ර තෙමේ දිව්‍ය සේනාවන් හා අහස් කුස පුරා සිටියේය.**

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

ලකුණු විග්‍රහය - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - **ලකුණු 15යි**

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - **ලකුණු 10යි**

3, 4 ප්‍රශ්නවල තෝරාගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන්ව විස්තර සහිතව ලියා තිබිය යුතු ය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| **උදාහරණ 04ට** | - | ලකුණු 04යි | ලකුණු 15 යි |
| **සමස්ත විස්තරයට** | - | **ලකුණු 11යි** | |

**3. (i) උපයුක්ත භාෂා රීතිය සහ**

**(ii) යෝග්‍ය උපමා භාවිතය**

**උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට** හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) දාරක ස්නේහය සහ

(ii) ස්වාමි භක්තිය

අතර දෝලනය වන චරිතයක් වශයෙන් සුප්පා දේවියගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් සාකච්ඡා කරන්න. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් සපයන්න.

අපේක්ෂිත උත්තර:

(i) උපයුක්ත භාෂා රීතිය

WWW.OLEVELAPI.COM

* කතාව කීමේ දී කෙටි වැකි යොදා ගැනීම.

"එසමයෙහි උත්තර පඤ්චාල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාහ. උභ තුමූ නුවණැත්තාහ. වියත්තාහ.........."

"ඒ තෙමේ සමීපයෙහි සිටි එකකුට එපවත් කීය. එයිත් "යමක් තමන්ට රුචි වී නම් ඒ තොපට දෙමියි කියා වේද උන් කීයෙ? උන් දෙනු කැමති දෙයක් හැර ගනුවයි කීයේය....."

* සංස්කෘත තත්සම වදන් මිශ්‍ර වාක්‍ය භාවිතය.

"ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නානා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු......"

"කොල පව්ටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල......."

"උපමා විෂයාතික්‍රාන්ත වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වැ ඒ අෂ්ට වංක මාණික්‍ය රත්නය අතින් ගෙනැ......"



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

* ✶ නාට්‍යරූපී දෙබස් සහිත වාක්‍ය යොදා ගැනීම.

  "දරුව, මසු දහස තොපට අභිප්‍රාය දැයි විචාරා එසේ ය කැමැත්තෙමි යි කී කල දරුව තොප විසින් මින් මට යමක් රුචි වී නම් ඒ දෙමියි. මෝ හට කියන ලද ද නොකියන ලද දැයි කියා......"

  "කිමෙක්ද පුත, මහෞෂධ පණ්ඩිතයෙනි?යි රජ්ජුරුවන් කී කල්හි 'ධර්ම යුද්ධයට යෙමි'යි වදාළ සේක. පුත මා විසින් කුමක් කළ මනා දැයි කීහ. දේවයන් වහන්ස කේවට්ටයා මැණිකකින් වංචා කරනු කැමැත්තෙමි......"

* ✶ සරල සිංහල රීතිය මතු කෙරෙන වාක්‍ය භාවිතය

  "එක් දවසක් මිනිසෙක් සහල් හැළියක් ද බත් මුළක් ද මසුරන් දහසක් ද හැර ගෙන ගඟින් එතෙර වෙමි යි ගඟ මැදට ගොස් දිය සැඩ හෙයින් එතෙර වූ ගඟ .......".

  "පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයාට කළමනා සත්කාර කොට හෙවත් මීයෙන් තැනූ විලඳ කවා බෙත් පෙලින් පියා සඟල මැඩ......."

(ii) යෝග්‍ය උපමා භාවිතය

* ✶ සාල්ලෙක ලාලා පාතට බානා කෙනෙකු මෙන්
* ✶ දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයක්හු මෙන්
* ✶ තල්පැන් පලක් මඬනා සේ
* ✶ දණ්ඩකින් පහරන ලද සර්පරාජයකු සේ
* ✶ කොක් කරක් සේ දික්වූ කර ඇති වූහ.

රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ පුද්ගලයින්ගේ හා අවස්ථාවන්හි ස්වභාවයට අනුකූලව මෙවැනි උපමා යෙදී ඇත.

ඇතැම් විට උපමා කීපයක් ද එකට යෙදුණු තැන් දක්නා ලැබේ.

* ✶ රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දක්නා වෙදකු පිළිසරණ වන්නා සේද
* ✶ සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේද
* ✶ පිපාසා ඇති එකකුට පැන් පුවහොත් මුත් පිපාසය නොසන්සිඳෙන්නා සේද
* ✶ රග්ගල් තලා මස්තකයෙහි නාද කරන සිංහ රාජයකු මෙන්
* ✶ කැටක් ගෙන වඳුරු රැසක් පලවන එකක්හු මෙන්ද
* ✶ දුන්නක් අල්ලා ගෙන වඳුරු මුළක් පලවන එකක්හු මෙන් ද
* ✶ නිගණ්ඨ සේනාවක් පරිද්දෙන්
* ✶ සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන්
* ✶ ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන්

WWW.OLEVELAPI.COM

මේ ආදී උපමා යොදා ඇත්නම් පිළිගන්න.

නැතහොත්

(i) දාරක ස්නේහය

* ✶ දරුවන් ප්‍රිය වදනින් ඇමතීම

  "මා ප්‍රිය පුතණුවනි හා දුවණියනි, මා වෙත එනු මැන. ප්‍රේමවන්ත දරුවෙනි මා හිඳිනු කන් යොමා...."

* ✶ දරුවන් ළඟට ගෙන විසිතුරු කතා කියාදීම

  "ඔබ පා මුල හිඳුවා මා
  වැඩෙන වයසෙ දි
  රාජ කතා කී විසිතුරු
  දැන් සිහි වන්නේ......"



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

* දරුවන් නඟන ප්‍රශ්නවලින් ඔවුන් තේරුම් ගැනීම

"සඟවන්ට තතු බැරිය පුතුගෙන්
මිගි නිති සොඳිනා පෙනෙන විලසා
අදහන් නැත කීවද මුසා
නැණ මුකුරා ගොස් ඇත පුරා වයසා"

* ඇත්ත තතු දරුවන් ඉදිරියේ නොසඟවා කීම.

"ඔබ පියාණෝ නරයකු නොව වනයෙහි දී මට හමු වූ සිංහ රාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රාජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි දරුවෙනි."

* දරුවන්ගේ සුභසිද්ධිය පතා ඔවුන් ගත් මග අනුමත කිරීම

"දරුවන් දෙදෙනා හට සෙත් ලැබෙනා
මග ඔස්සේ යා යුතු වන්නේ
නොසැලේ කිසි මේ වේලේ......."

(ii) <u>ස්වාමි භක්තිය</u>

* ස්වාමියා හැර නොයන ලෙසත් තනි නොකරන ලෙසත් කියා දරුවන්ට ඔහුගේ ගුණය වටහා දීම.

"මෙවන් බස් දොඩනු කිම
ඔබ පියා හැර දමා
යා හැකිද මේ ලෙනෙන්
අප නැතිව පියා ඔබ
ළය පැළී මැරී යයි"

* සැප සම්පත් හැරදමා ස්වාමියා සමඟ ප්‍රේමයෙන් බැඳී කල් ගෙවීම

"මේ සියල්ල හැර දා මම
ආවෙමි වලටා
වෙසෙන ලෙසා ඔබෙ පිය මා
සමිඳුන් සමඟා....."

* ස්වාමියා හා සතුටින් ජීවත් වූ බව දරුවන් ඉදිරියේ පැවසීම

"පුරුදු වූ වන වාසෙ
මෙහි සැපත නොසෑහෙද
ඔබ පියා සමඟිනා
මෙතෙක් කල් වින්ද මා......"

* සැමියා හැරයාමට සිදුවීම ගැන කම්පා වීම

"මා මෙසේ කරන්නේ හද තුළ ඇති වේදනාවකිනි. දිවි හිමියෙන් මා වේදනාවෙන් පෙළෙන බව දනිමි.

* ස්වාමියා හැරයාමට සිදු වීම ගැන සමාව අයැදීම හා ඔහුට ආශිර්වාද කිරීම

"දෙවියන් බාරයි මා සමිඳා
මා වෙත නොවනුය කෝපා
දරුවන්
කරනෙමි මෙබන්දා
සිහිවේ හැමකල්
සමා වනු ඇත වරදා"

*(උදාහරණ සඳහා ලකුණු 04යි. සමස්ත විස්තරයට ලකුණු 11යි. මුළු ලකුණු 15යි.)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

4. (i) පවතින දේ ඇති සැටියෙන් වර්ණනා කිරීමට සහ
(ii) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීමට

සැළලිහිණි සන්දේශ කතුවරයා දක්වන සාමර්ථ්‍යය එක් කොටසකට උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

(i) ජන කවියේ ඇති අව්‍යාජභාවයත්
(ii) භාෂා භාවිතයේ සරලත්වයත්

කුරක්කන් කවිවලින් නිරූපණය වේ. එක් කරුණක් සඳහා උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විමසන්න.

✶ පවතින දේ ඇති සැටියෙන් වර්ණනා කිරීම
- අඟ පිපිමල් මලිගිය ලිය කැලේයා
- මල්දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි
- රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී
- මඟ නිලමින් සිටි නා දොඹ නී පියල
- කස්තුරි තිලක සැදි නළලත සුමුටාන

✶ උචිත කාව්‍යෝපක්‍රම භාවිතය

අනුප්‍රාසාය - "වළඳින අදහසින් මෙන් සුරගඟ අඟන / අඟ පිපි මල් මලිගිය ලිය කැලේය."

මුල මැද අග එළිසමය - රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසි.

උපමා - නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල / නිල තුරඟුට නැගෙමින් රිවිදෙව් සිරින

රූපක - කර පුද වඩින රුඳි මුනි සිරිපා තඹර

ඉහත දැක්වෙන අංශ දෙක ගැනම කරුණු දක්වා තිබීම අවශ්‍ය වේ. ගැළපෙන වෙනත් නිදසුන් දක්වා ඇති නම් පිළිගන්න.

**නැතහොත්**

✶ ජනකවියේ අව්‍යාජත්වය

"දුරුතු මහේදී කැලයට වැදීලා"
"මා කී දේ දෙයියනි බොරුවක්ම නැති"
"හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්"
"කටු ඇල්ලේ මහ හේනේ කුරක්කන්"
"මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්"

✶ භාෂා භාවිතයේ සරල බව.

හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
මෙදා හේනේ පැහිලා ඇති කුරක්කන්
කුරක්කන් තුනයි වැපිරුවෙ අමාරුවේ
එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්

ඉහත සඳහන් අංශ දෙක සඳහා දී ඇති නිදසුන් හෝ වෙනත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

*(උදාහරණ සඳහා ලකුණු 04යි. සමස්ත විස්තරයට ලකුණු 11යි. මුළු ලකුණු 15යි.)*



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

**5.** දේශාභිමානී හැඟීම් ළමා සිත් තුළ ජනිත කරවීමට උචිත ලෙස බස හැසිරවීමෙහි ලා කවියා සතු දක්ෂතාව 'ජාතික තොටිල්ල' පැදිපෙළ තුළින් මනාව ඉස්මතු වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

- දේශාභිමානී හැඟීම් සඳහා නිදසුන්

✶ නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මෙලො වේ
යුතුකම ඉටුකළ යුතු වේ

✶ ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

✶ තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකලොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ

✶ ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

*(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)*

**6.** සාමාන්‍ය සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටි කතාකරුවා සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

WWW.OLEVELAPI.COM

✶ සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීම සාර්ථක කෙටි කතාවක ලක්ෂණයකි.

✶ මිල මුදල් අග හිඟ දුෂ්කරතා තිබුණද, සෑම ගැහැනියකම අන් අය ඉදිරියේ කැපී පෙනෙන ආකාරයට ජීවත් වීමට කැමති බව හෙළි වීම.
නිදසුන් : "පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ"
"කනේ කරේ දා ගන්න මුකුත්ම නැතිකම ගැනයි මං මේ දවස් ටිකේම කල්පනා කර කර සිටියේ. මේක මගේ හිතට ලොකු අමාරුවක්"

✶ නොසිතූ කරදරයක් වූ අවස්ථාවකදී ණය වීම.

✶ මැටිල්ඩා තම යෙහෙළිය වූ ෆොරෙස්ටියර් මහත්මියගෙන් ඉල්ලා ගත් දියමන්ති මාලය නැති වූ විට ණයට හා පොලියට මුදල් ලබා ගෙන මාලයක් මිල දී ගෙන එය භාර දී එම ණය සහ පොලී මුදල් ගෙවීම සඳහා දිවා රෑ නොබලා වෙහෙසීම.

✶ ණය බරින් මිරිකුණත් ඒ බව සමාජයට නොඅඟවා ජීවත් වීම.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- ✶ තමාට නොගැළපෙන විවාහයක් කර ගැනීමට සිදු වීම පිළිබඳව මානසිකව පසු තැවීම.
- ✶ තමාගේ දුක්, කරදර හා අසන්තෝෂය පිටතට නොපෙන්වා ජීවත් වීමට උත්සාහ ගැනීම.
- ✶ තම බිරිඳගේ රූමත්කම පිළිබඳව අන් අයට ප්‍රදර්ශනය කිරීමට සැමියා තුළ ඇති කැමැත්ත.
- ✶ සෑම අයෙකුම තමා ජීවත් වන සමාජ තලයට වඩා ඉහළ සමාජ තලයක අය ඇසුරු කිරීමට කැමති බව, මධ්‍යම පාන්තික ආකල්ප.
- ✶ දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී වැඩ කළත් අඩු ආදායමක් ඉපයීම.
  "ඇගේ සැමියා සවස් කාලයේදී කිසියම් වෙළෙන්දෙකුගේ ගිණුම් වාර්තා සකස් කිරීමෙහි යෙදුණේය. බොහෝ විට රාත්‍රි කාලය ඔහු ගත කළේ පැන්ස බාගයකට පිටුව ගණනේ පිටපත් කිරීමෙනි"
- ✶ සැමියා බිරිඳගේ සතුට වෙනුවෙන් කටයුතු කිරීම.
  (ප්‍රිය සම්භාෂණයට සහභාගි වීමේ අවස්ථාව ලබා ගැනීම. ඇයට අවශ්‍ය ඇඳුමක් ලබා ගැනීමට මුදල් දීම.)

*(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)*

**7.** 'ගංගාවේ සංගීතය' පැදිපෙළ රචනයේ දී පරිසරයේ සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදි භාෂාව භාවිත කිරීමට සමත් වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදි භාෂාව භාවිත කිරීමට සමත් වී ඇත.

ස්වාභාවික වස්තූන්ට සජීවී බවක් ආරෝපණය කිරීමට කවියා ගත් උත්සාහය සඳහා පහත සඳහන් නිදසුන් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

| | | |
|---|---|---|
| 1. | සංගීතවත් වී යම් ඉදිරියට | ගලා........ |
| 2. | "සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල | වෙමි..... |
| 3. | මී අඹ - කිරල - මාදම් ගෙඩි ළඳරු | වියේ..... |
| 4. | හිරිමල් සිනා රැළි පෙණ පිඬු | මිහිරිතම...... |
| 5. | කෙකටිය ඕලු නළියන දිය රැළි | මැද්දෙන් |
| 6. | කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල | කොට |

*(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....